රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2026

මගේ අංකය : EST-6/06/TVL/5010
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.04.09

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XIV වැනි පරිච්ඡේදයේ**
**8:2 උප වගන්තියේ සඳහන් සැතපුම් කුලී ගාස්තු ප්‍රමාණයන් සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 8:2 උප වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම උප වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමට 2026.01.12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

8:2 **ගාස්තු ප්‍රමාණයන් - පෞද්ගලික මෝටර් රථ -** මෙහි 8:1 උප වගන්තිය යටතේ සැතපුම් කුලිය ලැබීමට හිමිකම් ඇති නිලධරයෙකුට පෙට්‍රල් හෝ ඩීසල් මෝටර් රථයක් සඳහා කිලෝ මීටරයකට රු. 40/= බැගින් ද, යතුරු පැදියක් සඳහා කිලෝ මීටරයකට රු. 10/= බැගින් ද, විදුලි බලයෙන් ධාවනය වන මෝටර් රථයක් සඳහා කිලෝ මීටරයකට රු. 20/= බැගින් ද ගෙවනු ලැබේ.

03. ඒ අනුව, ආයතන සංග්‍රහයේ සැතපුම් කුලී ගාස්තු ප්‍රමාණයන් සඳහන් වන සියලුම ස්ථාන සඳහා ඉහත 02 හි සඳහන් ගාස්තු ප්‍රමාණයන් ආදේශ කළ යුතු ය.

04. සැතපුම් කුලිය ගෙවීම වෙනුවට නියමිත බලධරයන් විසින් දැනටමත් ප්‍රවාහන දීමනා ද ඇතුළත් වන ලෙස ගෙවනු ලබන පරිවර්තිත දීමනා මෙම විධිවිධාන අනුව සංශෝධනය නොකළ යුතු ය. දැනට විශේෂිත රාජකාරී ගමන් සඳහා අතිරේක ඉන්ධන ලබා දීම වෙනුවට සැතපුම් කුලිය හිමි ගන්වනු ලබන අවස්ථාවල දී නියමිත බලධරයා විසින් අදාළ නිලධරයා එම රාජකාරි ගමන ගිය බවට පෞද්ගලිකව සෑහීමකට පත්ව තිබිය යුතු ය.

05. මෙම චක්‍රලේඛ විධිවිධාන 2026.04.01 දින සිට ක්‍රියාත්මක වේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ad-6-est@pubad.gov.lk